Kumari, M.M. Nayana N.
PAPER

# හින්දී ජන ගීතයේ සමාජ මුහුණුවරඃ විමර්ශනාත්මක අධ්‍යයනයක්

M.M. Nayana Nuwan Kumari, Department of Hindi, University of Kelaniya

හින්දී ජන ගීතයෙන් නිරූපණය වන භාරතීය ජන ජීවිතය සහ ඒ හා බැඳුණු සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.
මිනිසා භාෂාව නිර්මාණය කොටගෙන සමාජ සම්බන්ධතා ස්ථාපිත කර ගැනීමට උත්සාහ ගත්දා සිට ජනශ්‍රැතියේ ද ආරම්භය සිදුවන්නට ඇතැයි යන්න සහේතුකව පිළිගත හැකි සත්‍යයකි. මානව භාෂාව, ජන ජීවිතය, සංස්කෘතිය සමඟ ජනශ්‍රැතියේ ඇත්තේ අවිච්ඡින්න සම්බන්ධයකි. සෑම ජන සමාජයකම එයටම අනන්‍ය වූ ජනශ්‍රැතියක් හිමිවන අතර සම්පූර්ණ ජන සමාජයම පිළිබඳ සමස්ත ඥානය එම ජනශ්‍රැතිය තුළ ගර්භිත වෙයි. අනාදිමත් කාලයක සිට මිනිසා විසින් මුඛ පරම්පරාගතව පවත්වාගෙන එනු ලබන ඥාන සම්භාරය ජනශ්‍රැතිය නමින් හඳුන්වන අතර ජන කතා, ජන කවි, යාතු කර්ම, ඇදහිලි හා විශ්වාස, ජන උත්සව, අධි විශ්වාස හා අභිචාර විධි, ජන නාටක, ජන ක්‍රීඩා, ප්‍රස්තාව පිරුළු ආදි සියලු ජනශ්‍රැතිකාංගයන් එහිලා අන්තර්ගත වන බව දැක්විය හැකි ය. ඕනෑම ජන සමාජයක ජන සාහිත්‍යය ලෙස අප හඳුනා ගන්නේ උක්ත ජනශ්‍රැතිකාංගයන්ගෙන් පෝෂණය වූ සාහිත්‍යයයි.
ජන සමාජය ප්‍රතිබිම්බනය කරන කැඩපත ජන සාහිත්‍යයයි. ජන ජීවිතය හා බැඳුණු සංස්කෘතිය, ජනයාගේ සිතුම්-පැතුම්, පරම්පරාගත විචාර, ආකල්ප, සංස්කාර ධර්මයන්, විශ්වාස ඇදහිලි, සොබා දහම, වන සතුන් සමඟ ජන ජීවිතයේ ඇති සබැඳියාව ආදි සියල්ල ජන සාහිත්‍යය තුළ අව්‍යාජත්වයෙන් යුතුව ප්‍රකාශනය වෙයි. එබැවින් සෑම ජන සමාජයක ම සංස්කෘතියේ මූලය සහ විකෘති නොවූ මූල රූපය ජන සාහිත්‍යය තුළ සුරැකී පවතී. භාරතය තුළද අනාදිමත් කාලයක සිට පැවත එන ජන සාහිත්‍යයක් උපලබ්ධ වන අතර පූර්වෝක්ත මාතෘකාව හා සමගාමී වන අයුරින් මෙම පර්යේෂණයේදී කතිකාවතට බඳුන් වන්නේ හින්දී භාෂක කලාපයට අයත් ජන සාහිත්‍යයයි. හින්දී ජන සාහිත්‍යය යන විෂය ක්ෂේත්‍රය විවිධ විද්වතුන් විසින් විවිධ වර්ගීකරණයන්ට ලක්කර ඇති අතර ඒ සෑම වර්ගීකරණයකම හින්දී ජන ගීතයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. මේ අනුව අධ්‍යයනයේ පහසුව සඳහා හින්දී භාෂක කලාපයට අයත් හින්දී ජන ගීතය පර්යේෂණ විෂය පරාසය ලෙස තෝරා ගැනේ. ජන විඥානය සකස් කිරීමෙහි ලා හින්දී ජන ගීතයෙන් සිදුවන මෙහෙවර පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙහිදී අපේක්ෂිතය. හින්දී ජන ගීත මෙන්ම මාතෘකාවට සමුචිත ප්‍රාමාණික ලිඛිත මූලාශ්‍රය සහ වෙනත් සාධක වෙතට ද සෘජුව අවධානය යොමු කෙරේ.

මුඛ්‍ය පද : ජන, ජනශ්‍රැතිය, ජන ගීතය, හින්දී භාෂක කලාපය, ජන සාහිත්‍ය වර්ගීකරණය